Article 11
Article 12(1).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2020-07-02

| | | | |
|---|---|---|---|
| වින්දිත පාර්ශවය | : | 1. | ඩබ්.ඩී. ප්‍රේමලතා මිය,<br>අංක. 21, කලුගල්හින්න, මාවතුර,<br>ගම්පොල. |
| | | 2. | බී.ඩී. හෂිනි ඉමාෂා මෙනෙවිය,<br>අංක. 21, කලුගල්හින්න, මාවතුර,<br>ගම්පොල. |
| වගඋත්තරකාර පාර්ශවය | : | 1. | විදුහල්පති,<br>මප/කොත්/නායාපාන මහා විද්‍යාලය,<br>මාවතුර, ගම්පොල. |
| | | 2. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>කොත්මලේ. |
| | | 3. | එරන්ද නාගහවත්ත මහතා,<br>ශාරීරික අධ්‍යාපන ගුරු,<br>මප/කොත්/නායාපාන මහා විද්‍යාලය,<br>මාවතුර, ගම්පොල. |

පැමිණිලි අංකය : **HRC/K/130/Suo motu/18**

**ස්ථාන පරීක්ෂණය අනුව පැමිණිල්ල :-**

මප/කොත්/නායාපාන මහා විද්‍යාලයේ ක්‍රීඩා ගුරුවරයෙකු විසින් එම පාසලේ 10 වසර ඉගෙනුම ලැබූ බී.ඩී. හෂිනි ඉමාෂා දැරියට පහරදී ගම්පොල රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගන්නා බවට 2018.02.26 දින ලක්බිම පුවත්පතේ පළවූ වාර්තාව අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් 2018.02.28 දින මප/කොත්/නායාපාන මහා විද්‍යාලයට පිටත්ව යන ලද අතර, එදින පහත අයවලුන්ගෙන් තොරතුරු ලබා ගෙන ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අදාළ විදුහලේ විදුහල්පති කේ.එම්.ටී.පී.එන්. හෙන්නායක මහතාගේ ප්‍රකාශයේ සඳහන් වන්නේ දැරියට පහරදීම සිදුවුවායැයි සඳහන් දින වන 2018.02.19 දින තමා පාසලේ නොසිටි බවත්, රාජකාරි කටයුත්තක් සඳහා කොත්මලේ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත පිටත්ව ගොස් සිටි බවත්ය. මෙම සිද්ධිය සිදුවී ඇත්තේ පාසල අවසන් වී පැය 1.45 පමණ බවත්, සිද්ධිය සිදුවීමෙන් පසු මේ පිළිබඳ විමසීම සිදුකර කොට්ඨාශ අධ්‍යක්ෂකවරයාට සිදුවීම පිළිබඳ දුරකථනයෙන් දැනුම් දී 2018.02.22 දින පහරකෑමට අදාළ දරුවාගේ දෙමාපියන් දැනුවත් කිරීම හේතුවෙන් පහරදීම සම්බන්ධ ක්‍රීඩාභාර ගුරුවරයා වන නාගස්වත්ත මහතා කැඳවා කරුණු විමසා අවවාද කළ බවත් සඳහන් කර ඇත.

පහරදීමට අදාළ ගුරුවරයා ඒ වන විට සම්බන්ධ කරගත නොහැකි වූ බැවින් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් සිසුවිය වාසය කරන කලුගල්හින්න ප්‍රදේශයට ගොස් ඇති අතර, එම අවස්ථාවේ දැරිය සිද්ධියට අදාළ පරීක්ෂණ කටයුතු සඳහා කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා කරන ලද කැඳවීමට පිටත්ව ගොස් තිබී ඇත. දැරියගේ පියා වන ඩී.බිතජි දුනුතිලක මහතාගෙන් කරුණු විමසීමේදී සඳහන් කර ඇත්තේ, දැරියට එම පාසලේ ක්‍රීඩා ගුරුවරයා පහරදීම නිසා 2018.03.19 සිට දින 05 ක් ගම්පොල රෝහලේ ප්‍රතිකාර ගත් බවයි. එම සිද්ධියට අදාළ ගුරුවරයා අත්අඩංගුවට ගනු ලැබුයේ සිද්ධිය සිදුවී 05 වන දිනයේ බවත්, (2018.03.28) එදින තම දරුවා රෝහලින් ටිකට් කැපූ දින බවත් සඳහන් කර ඇත.

එදිනම මෙම ගුරුවරයාට ඇප ලබා දී ඇති අතර, මෙම ගුරුවරයා මීට පෙර ඉගැන්වූ පාසල් වලද දරුවන්ට පහරදීමට අදාළ චෝදනා තිබෙන බවත්, ඒ පිළිබඳ සොයා බලන බවත් දුනුතිලක මහතා දැනුම් දී ඇත. එම පාසලේ 4 හා 7 ශ්‍රේණිවල ඉගෙනුම ලබන තමාගේ තවත් දරුවන් සිටින බවත්, ඉදිරියේදී ඔවුන්ට ඉන් බලපෑමක් සිදුවිය හැකි බවත් තවදුරටත් සඳහන් කර ඇත.

අදාළ පැමිණිල්ලේ තවදුරටත් කරුණු අනාවරණය කර ගැනීම සඳහා 2018.06.05 දින වින්දිත පාර්ශවය හා 01, 02 හා 03 වගඋත්තර පාර්ශවයන් කැඳවා පරීක්ෂණයක් සිදුකරන ඇති අතර, එකී පරීක්ෂණයේදී, වින්දිත පාර්ශවයේ ඩබ්.ඩී. ප්‍රේමලතා මහත්මිය කරුණු දක්වමින් බී.ජී. හෂිනි ඉමාෂා පස්දෙනෙකුගෙන් යුතු පවුලේ තුන්වන දියණිය බවත්, ඇය මප/කොත්/නායාපාන මහා විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, තමාගේ කුඩා දරුවා මතුෂ ප්‍රවීන එම පාසලේ 4 ශ්‍රේණියේ හා දෙවැනි දරුවා සචිනා හිමාෂා 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන බව සඳහන් කර ඇත. 10 වසරේ ඉගෙනුම ලබන හෂිනි ඉමාෂා හා අනෙකුත් ළමුන් දෙදෙනා පාසල ඇරී පාසලේ සිට මාවතුර නගරයට බසයෙන් ඇවිත් එතැන් සිට තමා හෝ දරුවන්ගේ පියා සමඟ නිවසට යන බවත් මෙම සිද්ධිය සිදුවූ දින එනම් 2018.02.19 දින පාසල් ගොස් නැවත දැල්පන්දු ක්‍රීඩා පුහුණු කිරීම් කටයුතු තිබුණද අසනීප තත්වයක් නිසා එදින පුහුණුවීම් වලට නොඉඳ විදුහලේ සිට පාරේ අනික් පැත්තට තවත් යහළුවන් කිහිපදෙනෙකු සමඟ එනවිට ක්‍රීඩා භාර නාගහවත්ත සර් පැමිණ පුහුණුවීම් වලට එන්නේ නැද්ද කියා අසා ඇති බවත්, එම අවස්ථාවේදී තම දියණිය පැමිණීමට නොහැකි බව ප්‍රකාශ කිරීම හේතුවෙන් ඇයගේ කම්මුලට පහරදුන් බවට ඇය නිවසට පැමිණි පසු තමා වෙත පවසන ලද බවත් ප්‍රකාශ කර ඇත. ඉන් පසු තම දියණිය කණේ කැක්කුම ඇති බවට ප්‍රකාශ කළ බවත්, ඉන්පසු එදිනම පාසල ලඟට ගොස් විදුහල්පතිතුමාට දුරකථනයෙන් ඒ බව

පැමිණිලි කළ බවත්, පසුව දූවගේ කණ රිදෙන නිසා ගම්පොල රෝහලට ඇතුළත් කර දින 4-5 පමණ ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත. මහනුවර රෝහල වෙතද පරීක්ෂා කිරීම සඳහා යොමු කරන ලද බවත්, කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතද පුස්සැල්ලාව පොලිස් ස්ථානයටද මේ පිළිබඳ පැමිණිලි කරන ලද බවත් සඳහන් කර ඇත.

පහරකෑමට ලක්වූ හෂිනි ඉමාෂා දූනුතිලක ශිෂ්‍යාවගේ ප්‍රකාශය :-

පහරකෑමට ලක් වූ දරුවා වන හෂිනි ඉමාෂා දූනුතිලක දරුවා විසින් සිය ප්‍රකාශයේ දක්වා ඇත්තේ තමා ගම්පොල නායාපාන විද්‍යාලයේ 10 ඩී ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, පාසල් නෙට්බෝල් ක්‍රීඩා කණ්ඩායමේද සාමාජිකාවක් වන බවත්, 2018.02.19 දින පාසැල අවසන් වී නෙට්බෝල් පුහුණුවීම් තිබුණද එදින එකී පුහුණුවීම් වලට නොයා විද්‍යා පංතියට යෑමට තවත් යහළුවන් සමඟ පාරේ අනික් පැත්තට යන විට තමාව දුටු ක්‍රීඩා භාර ගුරුවරයා වන නාගහවත්ත සර් පැමිණ නෙට්බෝල් පුහුණුවීම් සඳහා පැමිණෙන්නේ නැද්දැයි විමසූ විට එදින විද්‍යා පන්තියට යාමට ඇති බැවින් පැමිණීමට නොහැකි බවට තමා විසින් පැවසූ බවත්, එම අවස්ථාවේදී "උඹට ඉස්කෝලේ තියන පංතිද පිට පංතියද වැදගත්" යැයි පවසමින් තමාගේ කම්මුලට පහරක් ගසන ලද බවත්, එවිට තමාගේ කම්මුල අවට වේදනාවක් දැනුනු අතර, ළමයින් බලාගෙන සිටි නිසා ලැජ්ජාවක් ඇති වූ බවත් එබැවින් විද්‍යා පංතිද නොයා නිවසට විත් තම මවට විස්තරය දන්වන ලද බවත් එම අවස්ථාවේදී තමාගේ කණේ වේදනාවක් ඇතිවූ බැවින් ගම්පොල රෝහල වෙත ගොස් දින 4-5 ක් ප්‍රතිකාර ගන්නා ලද අතර, තමාව මහනුවර රෝහල වෙතද යොමුකරන ලද බවත්ය.

නායාපාන විදුහලේ ක්‍රීඩාභාර ආචාර්ය එරන්ද දේවප්‍රිය බණ්ඩාර නාගවත්ත යන අයගේ ප්‍රකාශය :-

වගඋත්තරකාර නායාපාන විදුහලේ ක්‍රීඩාභාර ආචාර්ය එරන්ද දේවප්‍රිය බණ්ඩාර නාගවත්ත යන අයගේ ප්‍රකාශයේ සඳහන් වන්නේ, තමා 2010 වසරේ සිට ගුරු වෘත්තියේ නියැලී සිටින බවත්, තමා නායාපාන විදුහලට පැමිණ මාස 03 ක පමණ කාලයක් වන අතර, පාසලේ ක්‍රීඩා කුසලතා වර්ධනය සඳහා කටයුතු කරනු ලබන බවත්, පාසලේ පසුගිය කාලයේ ක්‍රීඩා උත්සවය සඳහා විශාල කැප කිරීමක් කර ළමයින් පුහුණුවීම් කටයුතු කරන ලද අතරම නෙට්බෝල් කණ්ඩායම් පුහුණු කටයුතුද තමා විසින් සිදුකරනු ලබන බවත්, නෙට්බෝල් පුහුණු කටයුතු සතියකට එක් දිනක් පාසල් වේලාවෙන් පසු යොදාගනු ලබන අතර එකී පුහුණු කටයුතු සඳහා තම සහයට පාසලේ ගුරුවරියන් දෙදෙනෙකුද සිටින බවත්ය.

2018.02.19 දින නෙට්බෝල් පුහුණු කටයුතු තිබූ දිනයක් වන අතර, මෙම පැමිණිල්ලේ දක්වා ඇති දැරිය කණ්ඩායමේ සාමාජිකාවක් වූ බවත්, ඇය පුහුණුවීම් වලට සහභාගී නොවී පාසලින් පිටතට යනු දුටු බැවින් තමා ඇය වෙත ගොස් "මොකද අද ප්‍රැක්ටිස් එන්නේ නැද්ද" යනුවෙන් විමසූ විට "අද එන්න වෙන්නේ නැහැ. අද විද්‍යා පන්තියට යන්න ඕනෑ" යනුවෙන් පවසන ලද බවත්, එවිට "එන්නේ නැත්නම් කියලා යන්න ඕන. ළමයින්ගේ වගකීමක් තියෙන්න ඕන. සමහරු බොරුවට යනවා. සමහරු ප්‍රේමවන්තයෝ එක්ක යනවා" යනුවෙන් පවසන ලද බවත්, එම අවස්ථාවේදී අවට ළමයින් කිහිප දෙනෙකු සිටි බවත් එවිට ඇය සැර පරුෂ ලෙස 'සර්ට වැඩක්

නැහැනේ ඒවා මට ඕන නිසා මම යනවා' යනුවෙන් පවසන ලද බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේ අවට ළමයින් කිහිප දෙනෙකු සිටි බැවින් ගුරුවරයෙකු ලෙස තමා විශාල අපහසුතාවයකට පත්වූ බවත්, එහිදී ඇති වූ ආවේගය හේතුවෙන් තමා විසින් ඇයගේ කම්මුලට පහරක් එල්ල කළ බවත් සඳහන් කර ඇත. අනතුරුව මෙම ළමයා හඩමින් ගිය බවත්, පැය භාගයකයට පසු ළමයාත්, අම්මාත් තවත් නාදුනන පුද්ගලයෙකුත් පැමිණ තමා වෙත තර්ජණාත්මකව කතා කළ බවත් එහිදී එම අය “සර්ට ගහන්න අයිතියක් නැහැනේ” යනුවෙන් පවසන ලද අතර, ළමයාද එම අවස්ථාවේදී ‘මොන රෙද්දදකටද සර් මට ගැහුවේ ඉන්න බැරි හේතුව මම කිව්වනේ ’ යනුවෙන් පවසන ලද බවත්, එවිට ළමයාගේ අම්මාද ළමයාගේ කම්මුලට (තමා විසින් පහරදුන් පැත්තටම) පහර දුන් බවත්, එම හේතුවෙන් ළමයාට යම් දෙයක් සිදුවීමට හැකියාව ඇති බවත්, මා පහරදුන්නේ ආවේගය හේතුවෙන් බවත්, නීතිය අනුව ඕනෑම දඩුවමට අවනත වන බවත් සඳහන් කර ඇත.

**නයාපාන විද්‍යාලයේ විදුහල්පති කේ.එම්.කේ.පී.පී. හෙන්නායක මහතාගේ කරුණු දැක්වීම :-**

මෙම සිද්ධිය වූ දින වන 2018.02.19 දින තමා පාසලේ නොසිටි අතර, කොත්මලේ කලාප කාර්යාලයට රාජකාරී සඳහා පිටත්ව ගොස් සිටි බවත්, සවස තමා හට මෙම ආරංචිය ලැබීමෙන් පසු තමා විසින් මේ පිළිබඳ ලොග් සටහන් යොදා කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා දැනුවත් කළ බවත්, ඒ අනුව පරීක්ෂණය පැවැත්වූ බවත් සඳහන් කර ඇත.

**කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විපුලරත්න මහතාගේ කරුණු දැක්වීම.**

මෙම සිද්ධියට අදාළව සියළු පාර්ශව කැඳවා පරීක්ෂණ කටයුතු සිදුකරන ලද බවත් එහිදී ඉදිරිපත් වූ සියලු කරුණු අනුව අදාළ පහරදීම ගුරුවරයා විසින් සිදුකර ඇත්තේ, ගුරුවරයාගේ අභිමානය බිඳ වැටීම නිසා බැවින් ඔහුට අවවාද කිරිමක් පමණක් සෑහෙන බවත්, ඉදිරියේදී මෙම දරුවාට පාසලේ ගැටළුවකින් තොරව අධ්‍යාපනය ලබා දීමට අවස්ථාව ලබාදිය යුතු බවත් ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

වින්දිත සිසුවියට පාසලේ ගුරුවරයා විසින් පහරදිම හේතුවෙන් සිසුවිය දින 05 ක් පමණ ගම්පොල රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගෙන ඇති අතර, අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව උගුර, කණ, නාසය සම්බන්ධ වෛද්‍යවරයාගේ පරික්ෂාවට අනුව ඇයගේ දකුණු කණේ කර්ණපටහා පටකයේ (Tympanic membrane) ඉදිමීමක් දක්නට ලැබෙන බවත් දක්වා ඇත. ඒ අනුව තුවාල වී ඇති ආකාරය දැක්වෙන කරුණුත් තුවාලයත් සැසඳෙන බව නිරික්ෂණය වේ.

වගඋත්තරකාර ගුරුවරයාද සිසුවියගේ කම්මුලට පහරක් එල්ල කරන ලද බව පිළිගෙන ඇති අතර අදාළ පහරදීම පිළිබඳ වගඋත්තරකාර ගුරුවරයා විසින් සාධාරණීයකරණය කරමින් සඳහන් කර ඇත්තේ ළමයාට පුහුණුවීම

සඳහා පැමිණෙන ලෙස දැන්වීමේදී ඇය විසින් අනෙක් සිසුන් ඉදිරියේ තමාට අපහාස වන පරිදි තර්ජණාත්මකව පිළිතුරු සැපයූ බැවින් වූ ආවේගය නිසා පහරදීම සිදුකරන ලද බවයි.

මේ පිළිබඳ කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්ද දෙපාර්ශවය කැඳවා පරීක්ෂණ සිදුකර ඇති අතර, ඔහු විසින් ඉදිරි කටයුතු සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්වරයාට යොමු කර ඇති 2018.03.02 දිනැති ලිපියේ නිගමනය හා නිර්දේශවල සඳහන් වන්නේද අදාළ පහරදීම සිදුකර ඇත්තේ ද්වේෂ සහගතව නොවන බවත්, හුදෙක් පහරදීම සිදුකර ඇත්තේ ශිෂ්‍යාවගේ ප්‍රතිචාරය ගුරුවරයාගේ අභිමානයට හානිකර වීම නිසා වන බවත් ගුරුවරයාට අවවාද කිරීමක් සෑහෙන බවත්ය.

මෙම පහරදීමට අදාළව පුස්සැල්ලාව පොලිසිය විසින් වගඋත්තරකාර ගුරුවරයා අත්අඩංගුවට ගෙන නඩු පවරා දැනට විභාග වෙමින් පවතින බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පාසල තුළ විනය ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛයේ 2.1 වගන්තියට අනුව, “පාසල තුළ අපේක්ෂිත චර්යාවන්ට නොගැලපෙන චර්යාවන් දක්වන සිසුන්ගේ එම චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව දඬුවම් පැමිණවීම මඟින් එය අදාළ සිසුන්ගේ ඉගැනුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා අනාගතයේදී සමාජ විරෝධී චර්යාවන්ට යොමු වීමට පවතින ඉඩකඩ වැඩිවීම මෙන්ම පසුකාලීනව ඔවුන් තුළ දැඩි මානසික ආතති තත්වයන්ද වර්ධනය වීම සිදුවිය හැකි බවත්, එම නිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සත්භාවයෙන් යුතුව වුවද කිසිදු ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් වියහැකි ආකාරයේ දඬුවම් ලබා දීමෙන් වැළකී සිටීමට සියළු දෙනා වගකිවයුතු බවත්” දක්වා ඇත.

ශ්‍රී ලංකාව විසින් 1989 අත්සන් කර ස්ථිර කර ඇති එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28(2) වගන්තිය මඟින්ද පාසල් විනය පරිපාලනය ළමයාගේ මානව හිමිකම් ගරුත්වයට අනුකූල වන ආකාරයට සිදුකළ යුතු බවට අවධාරණය කර ඇත.

අදාළ පහරදීම සිදුකළ ගුරුවරයා විසින්ම කොමිෂන් සභාව ඉදිරියේ පහරදුන් බව පිළිගෙන ඇති බැවින්ද, පහරදීම නිසා ශිෂ්‍යාගේ දකුණු කණ් ප්‍රදේශයට හානි සිදුවී ඇති බවට වෛද්‍ය වාර්තා වලින් තහවුරු වී ඇති බැවින් වගඋත්තරකාර ගුරුවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත “කිසිම තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය”. යන ව්‍යවස්ථාවත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීමටද නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේ යන ව්‍යවස්ථාවත් උල්ලංඝනය කර ඇති බව මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරමි.

නිර්දේශය :-

01. මෙම නිර්දේශයේ පිටපතක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකරනු ලබන අතර මෙම ගුරුභවතා සම්බන්ධව අභ්‍යන්තර විනය පරීක්ෂණයක් සිදුකර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් කළ යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශ වෙත දන්වා සිටිමු.

02. එසේම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු සියළුම නිලධාරීන්ට හා ගුරුභවතුන් සඳහා ළමා අයිතිවාසිකම් ඇතුළු මූලික අයිතිවාසිකම් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමටද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුය.

2020. 08. 04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
- ඉහත 1 හා 2 නිර්දේශයන් ක්‍රියාත්මක කර කොමිෂන් සභාවට වාර්තා කිරීම සඳහා

B/